# ශ්‍රී ලංකාවේ සුළු ගොවි අංශයෙහි කෘෂිකාර්මික ගැටළු

**වර්තමානයේ තාක්ෂණික අතින් ඉතා දියුණු වූ යුගයක පවා, කෘෂිකර්මාන්තය මානව ක්‍රියාකාරකම් අතර ඉතාම වැදගත් තනි ආර්ථික අංශයක් බවට පත්ව තිබේ.** එය, වඩා විශ්වාසදායි ආහාර නිෂ්පාදන අංශය පමණක්ම නොව, කාර්මික කටයුතු සඳහා අවශ්‍ය කෙඳි වර්ග, රසායනික වර්ග හා වෙනත් අමුද්‍රව්‍ය නිෂ්පාදන අංශය බවට ද පත්ව තිබේ. එපමණක් නොව, කෘෂිකාර්මික අංශයෙහි ශ්‍රම හමුදවෙන් අති විශාල ප්‍රතිශතයකට රැකියා ද සැපයෙයි. දියුණුවන රටවල ජනගහනයෙන් 60% - 70% කගේ පමණ ප්‍රධානතම ජීවනෝපාය කෘෂිකර්මය වන අතර, දළ වශයෙන් ජනගහනයෙන් 70%-80% ක්, කිනම් ආකාරයකින් හෝ කෘෂිකාර්මික නිෂ්පාදන කාර්යයෙහි නියැලි සිටී. **ලෝකයේ දියුණු රටවල පවා කෘෂිකර්මාන්තය, ආර්ථිකයේ බලපෑම් ඇති කළ හැකි එකම අංශය බවට තහවුරු වී තිබේ.** ශ්‍රී ලංකාව කෙරෙහි බලන විට කෘෂිකර්මාන්තය තරම් ජන ජීවිතය කෙරෙහි මහඟු බලපෑම් ඇති කළ හා ඇති කළ හැකි තවත් ආර්ථික ක්‍රියා මාර්ගයක් නැත.

**කෘෂිකර්මාන්තය ස්වභාව ධර්මයේ දයාදයකි. කාලාන්තරයක් තිස්සේ වර්ධනය කරගත් සාම්ප්‍රදායික තාක්ෂණය විසින් එම ස්වභාව ධර්මයේ දයාදය අපේම උරුමයක් කරගෙන තිබේ.** ඒ නිසාම පැරණි ගැමියෝ **"දන වෙළඳම, නොදන ගොවිතැන"** යනුවෙන් ආප්තෝපදේශයක් හඳුන්වා දුන්නෝය. අද තත්ත්වය මීට වඩා වෙනස් ය. මිනිසාගේ විද්‍යාත්මක සොයා ගැනීම් හා තාක්ෂණ දියුණුවත් සමඟ, ස්වභාව ධර්මයේ දයාදය විටින් විට අවතීර්ණ වූ ගැටළු අභියස, අභියෝගාත්මකව මුහුණ දියයුතු තත්ත්වයට පත්ව ඇත. මේ අනුව **"දන ගොවිතැන, නොදන වෙළඳම"** වශයෙන් එම ආප්තෝපදේශය අග මුල මාරු කළ යුතුව තිබේ.

**කෘෂිකර්මාන්තය ස්වභාව ධර්මයේ දයාදයකි. කාලාන්තරයක් තිස්සේ වර්ධනය කර ගත් සාම්ප්‍රදායික තාක්ෂණය විසින් එම ස්වභාව ධර්මයේ දයාදය අපේම උරුමයක් කොට ගෙන තිබේ.**

ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මික අංශය නැතහොත් සුළු ගොවි අංශය, දනට දශකයක හෝ දෙකක පමණ කාලයක සිට නව අභියෝගයන්ට පාත්‍ර වෙමින් පවතින බවත්, සීඝ්‍ර පිරිහීමකට ලක් වූ ආර්ථික කාර්යාංශයක් බවත්, ආර්ථික විචාරකයින්ගේ අදහස වී තිබේ. එම විවේචනයන් ඒ ආකාරයෙන්ම පිළිගැනීමට අසීරු වුවත්, සුළු ගොවි අංශය තීරණාත්මක අභියෝගයන් ඉදිරියේ අසරණ වනු ඇතිදැයි යන්න විමසිය යුතු කරුණකි. සුළුගොවි අංශයේ පරිහානිය, එසේ නොවේනම් නව අභියෝගයන් සහ ගැටළු සහිත සාධක කිහිපයක් නිසා පෝෂණය ලබන බවත්, විචාරාත්මක ලියැවිලි මගින් පැහැදිලිව පෙනේ. මෙම සාධකයන් සමස්ථ වශයෙන් විමර්ශනයට ලක් කල විට පහත සඳහන් ආකාරයට දක්විය හැකිය.

**ගොවි ප්‍රජාවගේ සමස්ථ සහභාගීත්වයකින් තොරව, ගොවිපොල කාර්යක්ෂමතාවය හා නිෂ්පාදන ඵලදායිතාවය වර්ධනය කරගත නොහැකිය.**

* නවීන බෝග වර්ග හා අනුමත කෘෂි යෙදවුම් භාවිතය මගින් ගොවිපල පිරිවැය සීඝ්‍රලෙස ඉහළ යෑම,
* වියදමට සාපේක්ෂ ව මිලෙහි වැඩිවීමක් නොමැතිවීම.
* අතරමැදියන්ගේ සූරා කෑම,
* යෙදවුම්වල ගුණාත්මකභාවය පිරිහීයාම හා ඵලදාව අඩුවීම.
* විශ්වාසදායි හා කාර්යක්ෂම කෘෂි ණය ක්‍රමයක් නොමැති වීම,
* කෘෂිකාර්මික සහායක සේවා අංශය පිරිහී තිබීම, හෝ සහායක රාජ්‍ය සේවා අංශ දුර්වල වීම,
* විශ්වාසදායි කෘෂිකාර්මික බීජ ලබා ගැනීම දුෂ්කර වීම, හෝ ප්‍රමාණවත් නොවීම,
* වාරි ජල කළමනාකරණ

අංශයේ දුර්වලතා,

* ප්‍රමාණවත් පරිදි වාරි මාර්ග පහසුකම් නොලැබීම හා පසුතල සංවර්ධනය ප්‍රමාණවත් නොවීම,

**කෘෂිකාර්මික සහායක සේවා කටයුතු වැනි සේවාවන් කෙරේ සුළු ගොවියන්ගේ ඉල්ලුම සැහීමකට පත් විය නොහැකි තත්ත්වයේ ඇති බව සමීක්ෂණවලදී හෙළි වී තිබේ.**

* ඉඩම් හිඟය හා ඉඩම් කැබලි වීම,
* වෙනත් ලාභදායි රැකියා සුලභ නිසා තරුණ තරුණියන් ගොවිතැනින් ඉවත්වීම,
* විවෘත ආර්ථිකය යටතේ මෙරට නිෂ්පාදන අස්වනු නෙලන කාල පරිච්ඡේදයන් හි පිටරටින් බදු සහන යටතේ ආහාර ද්‍රව්‍ය ආයාත කිරීම හා බෙදහැරීම (මේ මගින් රට තුල ආහාර අතිරික්තයක් ඇති කොට දේශිය නිෂ්පාදන බාල්දු කිරීම) හා
* ව්‍යුහාත්මක අලෙවිකරණ ගැටළු යන ආදියයි.

## රජයේ මැදිහත් වීම

මෙවැනි ඉතා සංකීර්ණ වූ ගැටළු එක් එක් ගොවිපල කෙරෙහි (Farming System) වෙනස් ආකාරයකින් බලපෑ හැකිය. මෙම ඉතා සංකීර්ණ ගැටළු මාලාව එක ස්ථානයක එකවිට දකිය නොහැකිය. විවිධ වූ ගොවිපල පරිසරවල විවිධ වූ මුහුණුවරයන්ගේ බලපෑම් ඇතිකළ හැකි බව පමණක් හඳුනා ගත යුතුව තිබේ. මෙම සියලුම සංකීර්ණ ගැටලු විමර්ශනයට ලක් කිරීම ද අසීරුය. එසේ වූවද වඩා අවධානය යොමු විය යුතු තීරණාත්මක හා වාදයට පාත්‍ර වූ ප්‍රධාන ගැටළු (issues) පමණක් විමර්ශනය කිරීම කාලෝචිත ය. අනෙක් අතට බහුජාතික සමාගම් මගින් කෙරෙන නිෂ්පාදන වල මිල හා ඒවායේ ගුණාත්මක භාවය ද නිරන්තරව විමර්ශනයට ලක් කල යුතු වේ. **මේ හා සමාන ඉතාම වැදගත් කරුණක් නම් ගොවිපල කාර්යක්ෂමතාවය හා නිෂ්පාදන ඵලදායිතාව වර්ධනය කිරීම ආශ්‍රිත ගැටළුවයි. ගොවියන් ගේ, ගොවි ප්‍රජාව ගේ සමස්ථ සහභාගිත්වයකින් තොරව, ගොවිපල කාර්යක්ෂමතාවය හා නිෂ්පාදන ඵලදායිතාවය වර්ධනය කරගත නොහැකිය.** මෙහිදී ගොවිපල ශ්‍රම ඵලදායිතාවය රඳ පවත්වා ගැනීම සඳහා පවුලේ ශ්‍රමය ඵලදායිතාවයකින් යුතුව, වර්ෂය පුරා කිසියම් කෘෂිකාර්මික නිෂ්පාදන කාර්යාවලියක නියුක්ත කිරීමට හැකිවන පරිදි අප රටෙහි සුළු ගොවි අංශයට ඉතා යෝග්‍ය වූ ගොවිපල ක්‍රම / පද්ධති හඳුන්වා දිය යුතු වේ. මේ සඳහා අවශ්‍ය මූලික පහසුකම්, යටිතල පහසුකම්, ඉදිකිරීම්, ගොවිපල කළමනාකරණය, සහායක සේවා ශක්තිමත් කිරීම හා පවත්වාගෙන යාම මෙන්ම අලෙවිකරණය වැනි කටයුතු කෙරෙහි රජයේ මැදිහත්වීම ඉතාම තීරණාත්මක වේ. රජය මේ කරුණු වලදී මැදිහත් වන්නේ විෂය කාර්යයන් අනුව සංවිධාන වූ රාජ්‍ය ආයතන මගිනි.

**ව්‍යාප්ති සේවා කටයුතු, ගොවි ණය, බීජ හා යෙදවුම් සැපයුම, නව තාක්ෂණ තොරතුරු, කෘෂිකාර්මික සහායක සේවා කටයුතු වැනි සේවාවන් කෙරේ සුළු ගොවියන්ගේ ඉල්ලුම සැහීමකට පත්විය නොහැකි තත්ත්වයේ ඇති බව සමීක්ෂණ වලදී හෙළි වී තිබේ.** අනෙක් අතට, රාජ්‍ය අංශයේ සංවිධාන ග්‍රාමීය මට්ටමේදී අපේක්ෂිත පරිදි ක්‍රියාත්මකව නැත. නිළධාරීන් තුල ඇති ගොවියා කෙරෙහි වන ආකල්පය හිතවත් එකක් ද නොවේ. මෙහිදී ගොවියන් ද නිළධාරීන් කෙරෙහි දක්වන ආකල්පය ද එයට වඩා අහිතකර වූවකි. **ගොවියන්ගේ ගැටළු හෝ ගොවි අවශ්‍යතාවන් හඳුනාගෙන අදළ තැන් වලට යොමු කිරීමට තරම් ආයතනික සංවිධානාත්මක පරිසරයක් ග්‍රාමීය මට්ටමේ නැත.** ගොවි සංවිධාන ද බලාපොරොත්තු වූ පරිදි සජීවීකරණයට ලක්ව නොමැත්තේය. ගොවියන් වෙනුවෙන් සංවිධානය වී ඇති සමහර වෘත්තීය සමිති, ග්‍රාමීය මට්ටමේ රජයේ දෙපාර්තමේන්තු නිළධාරීන් හෝ රාජ්‍ය නොවන සංවිධානවල සේවකයින් හෝ එදිනෙද හැර, සුළුගොවි අංශය සංවර්ධනය කිරීම කෙරෙහි දනුවත් කර නොමැත. සුළුගොවි අංශයෙන් ගොවි සංවිධාන ප්‍රමාණවත් පරිදි සජීවීකරණයකට ලක් කල යුතු අතර ගොවි සංවිධාන අරමුදල් සඳහා හෝ චක්‍රීය අරමුදල් සඳහා හෝ වෙනත්

**ගොවියන්ගේ ගැටළු හෝ ගොවි අවශ්‍යතාවන් හඳුනාගෙන අදළ තැන් වලට යොමු කිරීමට තරම් ආයතනික සංවිධානාත්මක පරිසරයක් ග්‍රාමීය මට්ටමේ නැත.**

ආධාර මහින් සැහෙන සම්පත් ප්‍රමාණයක් ග්‍රාමීය මට්ටමේ සුළු ගොවි සංවිධාන වෙත මුදාහැරිය යුතුව තිබේ.

**කළමනාකරණ හැදියාව හා කාර්මික ශික්ෂණය පිළිබඳව පුහුණුවක් ගොවියාට අවශ්‍ය වේ.**

## නව කෘෂිකර්මය හා ප්‍රවණතා

ලෝකය සමස්ථ වශයෙන් ගත් කල, නවීන කෘෂිකර්මය (Modern Agriculture) ආර්ථිකයන් තුල වඩාත් කාර්යක්ෂම කර්මාන්තය බවට පත්ව තිබේ. අඩු ඉඩම් ප්‍රමාණයකින් වැඩි ආහාර ප්‍රමාණයක් නිපදවීමේ හැකියාව ක්‍රමිකව වර්ධනය වී ඇත. දියුණු කාර්මික රටවල් ගත් විට ගොවි බිම් ප්‍රමාණය, 1900-1990 අතර කාලය තුළ (අක්කර) 10% - 15% ගුණයෙන් අඩු වී ඇති අතර, ආහාර නිෂ්පාදනය 40% - 55% ක ප්‍රමාණයකින් ඉහල ගොස් තිබේ. එසේ වුවද, තුන්වන ලෝකයේ රටවල් ගත් කල (දියුණුවන ලෝකයේ රටවල්) ගොවි බිම් ප්‍රමාණය 35%-45% ක ප්‍රමාණයකින් ඉහල ගොස් ඇති අතර, ආහාර නිෂ්පාදන ප්‍රමාණය ද 40% ක පමණ ප්‍රමාණයකින් වර්ධනය වීමක් වාර්තා වේ. මේ හේතුවෙන් තුන්වන ලෝකයේ රටවල් හි ආහාර නිෂ්පාදනය ඉහල ගොස් ඇති බව සාපේක්ෂ වශයෙන් සැලකිය යුතු වේ. ශ්‍රී ලංකාව ආශ්‍රිතව බලන කල පසුගිය දශක පහ තුළ, වී අස්වැන්න දෙගුණ තෙගුණ වී ඇති අතර, හොඳ වාරි කළමනාකරණ පරිසරයන් යටතේ, ජාත්‍යන්තර මට්ටමේ අස්වැන්නක් ලබාගත් අවස්ථා ද වාර්තා වේ. සෙසු ආහාර බෝග අස්වනු ද 30% - 60% පමණ ප්‍රමාණයකින් වර්ධනය වී තිබේ. වැඩි වූ නිෂ්පාදන වියදමට සාපේක්ෂව බලන කළ, මෙම අස්වනු වර්ධනයේ දී, ගොවියාගේ පැත්තෙන් බලන කළ, ඔහුගේ ලාභදායකත්වය සාපේක්ෂ වශයෙන් ක්ෂයවී ගොස් ඇති බව පෙනේ. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය, දියුණු බීජ වර්ග භාවිතය, රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක භාවිතය වැනි යෙදවුම් මහින් ගොවිපල නිෂ්පාදන ශක්තිය ක්‍රමිකව වර්ධනය කර ඇතත්, එයින් ගොවිජන ක්ෂේත්‍රයේ කලක් තිස්සේ පැල පදියම් වෙමින් තිබූ සමාජ ගැටළු, කෘෂි ඉඩම් හිඟය, ග්‍රාමීය ණය ගැතිභාවය, අඩු අදයම් හා දිළිඳුභාවය වැනි ගැටළු වලට නිසි පිළියම් ලැබී නොමැත.

ආර්ථික සැලසුම් කරුවන්ගේ අදහසට අනුව, ගොවියන්ගේ ප්‍රධාන අභිප්‍රාය විය යුත්තේ **"උපරිම ලාභ ලැබීමේ අපේක්ෂාවයි"**. පාරිභෝගිකයින්ගේ අංශයෙන් බලන කල ඔවුන් ආහාර මිලදී ගැනීමේදී තනිකරම මිල පිළිබඳ පමණක්ම සැලකිලිමත් නොවේ. අභිරුචිය, අවශ්‍යතාවය හා අනෙකුත් සමාජ අවශ්‍යතා හා

**ගොවියන්ගේ ප්‍රධාන අභිප්‍රාය විය යුත්තේ උපරිම ලාභ ලැබීමේ අපේක්ෂාවයි.**

අවබෝධයන්ට අනුරූපව පාරිභෝගිකයෝ ආහාර මිලදී ගැනීමේදී ක්‍රියාකාරි වෙති. **මේ නිසා, ගොවිපළ ක්‍රමයක් ස්ථාපිත වීම හෝ වර්ධනය වීම කෙරෙහි බලපාන හෝ පොළඹවන එකම සාධකය ලාභ උපරිම කිරීමේ අභිප්‍රායම නොවේ.** නිදහස් තීරණ ගැනීමේ අභිප්‍රාය, පාරිසරික අගයන්, ප්‍රජා කටයුතු හා පාරිසරික සෞඛ්‍යය හා සනීපාරක්ෂක තත්ත්වයන් වැනි අංශයන් අගය කිරීම ගොවි ප්‍රජාවගේ විශේෂ ලක්ෂණයකි. එහෙත් කර්මාන්තයක් වශයෙන් ගොවිතැනෙහි ලාභදායකත්වය, යම් කිසි මට්ටමක පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය මූලික අංගයක් බව නොකිවමනාය. ගොවියාගේ අපේක්ෂාව, සාපේක්ෂ ලාභදායකත්වය මතම රඳා පවතින බව, මෙහිදී අවධාරණය කළ යුතු වේ. එසේ හෙයින් **කළමනාකරණ හැදියාව හා කාර්මික ශික්ෂණය පිළිබඳව පුහුණුවක් ගොවියාට අවශ්‍ය වේ. සමස්ථ ව්‍යාප්ති සේවා හා කෘෂිකාර්මික සහායක සේවා පද්ධතිය මහින් මෙම අවශ්‍යතාවය ගොවි ප්‍රජාව තුළ වර්ධනය කල යුතුව ඇතත්, දශක කිහිපයක අත්දැකීම් ඇසුරින් බලන කල්හි, එම අවශ්‍යතාවය කෙරේ ජේන තෙක් මානයකටවත් ළඟාවී ඇති බවක් නම් පෙනෙන්නට නැත.** සුළුගොවි අංශයෙහි එකිනෙකට හඳුනාගත හැකි ගොවිපල ක්‍රම විශාල සංඛ්‍යාවක් ඇතත් ඒ ක්‍රමය නව ක්‍රමයකින් **විභේදනය කිරීම (Differentation)** ඉතා අසීරු කරුණකි. කෘෂිකාර්මික තාක්ෂණික **දැනුම විසරණය (Diffusion)** ක්‍රියාවලියේ දී ක්‍රියාකාරක හා ප්‍රතිලාභී පක්ෂ අතර අන්තර් සම්බන්ධතා දැඩි කිරීමේ හෝ ලුහුඬු කිරීමේ කාරකයක් වශයෙන් ගොවිපල ක්‍රම හා යෙදවුම් අවශ්‍යතා හඳුනාගත හැකිය. ගොවිපල පද්ධතියක් ගොවිපල වගා ක්‍රම කිහිපයකින් සමන්විත වේ. වගා ක්‍රම හඳුනාගනු ලබන්නේ එක් ක්‍රමයක් තවත් ක්‍රමයක් සඳහා රඳා පැවැත්වෙන නැඹුරුතාවය මතය. ගොවිපල

පද්ධතියක් ලාභදායී ලෙස පවත්වාගෙන යාමට නම් ගොවියන්ගේ කැපවීම අවබෝධය හා දැනීම ඉතා වැදගත් ය. සාම්ප්‍රදායික ගොවිපල ක්‍රමයෙන්

**සමාජ හා දේශපාලනික විපර්යාස ද කෘෂිකර්මය හා තදින් බැඳී සිටී.**

බැහැරව, දියුණු, වඩා ලාභදායී ගොවිපොල ක්‍රම කෙරෙහි අප රටෙහි සුළු ගොවියන් මන්දගාමීව නැඹුරු වන්නේ ඔවුන්ගේ සාම්ප්‍රදායික සමාජ හා ආර්ථික ජන ජීවිතය කෙරෙහි ඔවුන් තුළ පරම්පරාගතව වර්ධනය වී ඇති නැඹුරුතාවය නිසා විය යුතුය. මේ පිළිබඳව කර ඇති පර්යේෂණ අල්ප වන අතර, සමාජ විද්‍යාඥයින් විසින් මෙම මූලික සමාජ තත්ත්වයන් අධ්‍යයනය කළ යුතු කාලය එළඹී ඇති බව කිව යුතුව තිබේ.

ශ්‍රී ලංකාවේ සුළුගොවි අංශය කෙරෙහි හඳුනාගත හැකි ගොවිපොල පද්ධතීන්ගේ ගොවිපොල ක්‍රම කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

* විස්තෘත වගාව,
* කිරි පට්ටි පාලනය,
* උස් බිම් වල තෘණ වගාව,
* සූක්ෂම සත්ත්ව පාලනය,
* වාරි මාර්ග සහිත කුඹුරු ඉඩම් වගාව,
* වර්ෂා පෝෂිත කුඹුරු ඉඩම් වගාව,
* වර්ෂා පෝෂිත ගොඩ ගොවිතැන්,
* වාරි මාර්ග පහසුකම් සහිත ගොඩ බෝග වගාව,
* හේන් ගොවිතැන,
* මිශ්‍ර බෝග වගාව හා
* මිශ්‍ර ගෙවතු වගාව,

ආදී වශයෙනි. මෙම ගොවිතැන් ක්‍රම හුදකලාව වර්ධනය වී නොමැත. එක් ගොවිපොල කුටුම්භයක් මෙම වර්ග කිහිපයක ගොවිතැන් ක්‍රමයන් හි නියැලී සිටිය හැකිය. මෙම සංකීර්ණ ගොවිපොල ක්‍රම මගින්, ආදායම් සමබරව තබා ගැනීම, අවාසිදායක හා අවදානම් තත්ත්වයන්ට මුහුණදීම, පවුලේ ශ්‍රමය ඵලදායී ලෙස භාවිතා කිරීම, යෙදවුම් වැය අවම කර ගැනීම වැනි වාසිදායක තත්ත්වයන් පවත්වා ගෙන යා හැකිය. එක් ගොවිපොල ක්‍රමයක නිෂ්පාදනය තවත් ගොවිපොල ක්‍රමයක යෙදවුම් ලෙස භාවිතා කිරීම ද කළ හැකිය. මෙයින් මූල්‍ය පිරිවැය අවම කර ගත හැකි වේ. මෙම සියලුම ගොවිපොල ක්‍රමයන් එකට සම්බන්ධ කොට තබන්නේ ඒ ඒ ගොවිපොල කුටුම්භයන්ගේ ආර්ථික කළමනාකරණයයි. ඕනෑම ගොවිපොල ක්‍රමයක් ප්‍රධාන අභිමතාර්ථ 2 ක් මත රැඳී තිබේ.

i ආදායම් වශයෙන් ගිණුම් කරනු ලබන හෝ යැපුම් සඳහා ආහාර නිෂ්පාදන උපයෝගීතාව සපුරාලනු ඇතැයි සලකනු

**සමාජවිද්‍යාඥයන් හට මෙම මූලික සමාජ තත්ත්වයන් අධ්‍යයනය කළ යුතු කාලය එළඹ ඇති බව පැවසිය යුතු වේ.**

ලබන මට්ටමක පිහිටා සෑහීමකට පත්විය හැකි නිෂ්පාදන තත්ත්වයක් කරා ළඟාවීම

සහ

ii මෙම නිෂ්පාදන තත්ත්වය වඩා ස්ථිර මට්ටමක ගොවියන්ගේ වැඩ කළ හැකි ජීවිත කාල සීමාව තුළ පවත්වාගෙන යෑම. මෙහිදී ගොවියා සඳහා සැකසී ඇති සෑම ගොවිපොල සේවාවන්ගේ විශ්වාසනීයත්වය හා ගුණාත්මක භාවය තීරණාත්මක සාධකයන් වේ.

අප රට කෙරෙහි බලන විට ගොවිපොල සේවාවන් ගෙන් 90% කටත් වඩා සැපයෙන්නේ රජයේ අනුග්‍රහය ලද ආයතන හෝ රාජ්‍ය දෙපාර්තමේන්තු මගින් ය. මේ නිසා, ගොවිපොල සේවාවන්ගේ කාර්යක්ෂමතාවය සහතික කිරීම කෙරෙහි රජයේ වගකීම සුළු නොවේ. කෘෂිකර්මය ස්වභාව ධර්මයේ දායාදයක් වන්නේ දේශගුණික තත්ත්වයන් සහ වෙනත් භෞතික සාධක කෘෂිකාර්මික නිෂ්පාදන ඵලදායිතාවය කෙරේ තදින් බලපෑම් කරන බැවිනි. එමෙන්ම, **සමාජ හා දේශපාලනික විපර්යාස ද කෘෂි කර්මය හා තදින් බැඳී සිටියි. තවද සම්පත් හා අවස්ථායික (Opportunities) කළමනාකරණ සාධකය ද කෘෂිකාර්මික ඵලදායිතාව කරේ තදින් බලපායි.**

කෘෂිකාර්මික ඵලදායිතාවය කෙරේ බලපානු ලබන පාරිසරික සාධක පිළිබඳ හැඳින්වීමක් කිරීම මෙහිදී යෝග්‍යය. මූලික කෘෂිකාර්මික ක්‍රියාවලිය නම්, එනම් කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්, විටමින්, මේද යන රසායනික ප්‍රපංචයන්, පදර්ථ බවට පරිවර්තනය කරමින්, ගහකොළ නිෂ්පාදනය කිරීමයි. මේ ක්‍රියාවලිය පෙනෙන පරිදි ස්වාභාවික පාරිසරික පද්ධතිය මත රැඳී තිබෙන අතර, **මානව ක්‍රියා මගින් මෙම ක්‍රියා පද්ධතිය සැකසීම හා උපයෝගී කර ගැනීමට උත්සාහ කිරීම, කෘෂිකර්මාන්තය වශයෙන් හැඳින්විය හැකිය.** ස්වභාව පරිසරයේදී, දේශගුණය, පාංශු

සම්පත, වාතය හා ගස් වැල්වල මූලික භෞතික විභවතාවයන් ප්‍රධාන තැනක් ගනී. මේවා ස්වභාව සම්පත් වශයෙන් ද හැඳින්විය හැකිය. **වෙනත් දේශගුණ වලට වඩා මධ්‍යධරණී දේශගුණය සමහර පළතුරු වර්ග වගාවට හිතකරය.** වර්ෂාපතනය, පිරිවැයෙන් තොර සම්පතකි. තවද අර්ධ ශුෂ්ක ප්‍රදේශවල වාරි කළමනාකරණ කටයුතු සඳහා අතිරේක පරිශ්‍රමයක් දරණ නිසා ජලය ද පිරිවැයක් වේ. මේ අනුව, පාරිසරික සාධකය ගොවිපොල ලාභදායිතාව හා ඵලදායිතාවය කෙරේ සෘජුව හෝ අතියම් ලෙස බලපෑම් ඇති කරන බව පෙනේ. පසෙහි, ස්වභාවයෙන් හිමි සාරභාවය ගිලිහී ගිය කල්හි රසායනික පොහොර හෝ වෙනත් පොහොර සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදු වේ. පාංශු ඛාදනය වැළැක්වීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගැනීමට සිදුවුවහොත්, එයින් ගොවිපොල පිරිවැයට අතිරේක එකතුවක් සිදු කෙරේ. අධික සූර්ය ශක්තිය ද කෘෂිකාර්මික නිෂ්පාදනයට මහෝපකාරී වූවකි. එසේ වුවද, ශුෂ්ක ප්‍රදේශවල වාරි මාර්ග සංවර්ධනය සඳහා අතිරේක පිරිවැයක් දැරීමට සිදුවේ. **ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශවල කුඹුරු වලට වඩා වියළි කලාපයේ කුඹුරුවල ඵලදායිතාවය ඉතා ඉහලය.** එනමුදු වාරිමාර්ග ආශ්‍රිත උස් බිම් වගාව සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුව තිබේ. වර්ෂා පෝෂිත ගොඩ ඉඩම් වලට වඩා වාරිමාර්ග සහිත ගොඩ ඉඩම්වල, මිශ්‍ර හා වෙනත් අතිරේක ආහාර බෝග වගාව ඉතා සාර්ථක ය. මෙහිදී ද වාරි කටයුතු ඉන්ධන, ශ්‍රම වියදම් වෙනුවෙන් අතිරේක පිරිවැයක් දැරීමට සිදු වේ.

**වෙනත් දේශගුණයන් ට වඩා මධ්‍යධරණී දේශගුණය සමහර පළතුරු වර්ග වගාවට හිතකර වේ.**

සමාජ දේශපාලනික හා ආර්ථික පාරිසරික සාධකය පිළිබඳ සලකා බලමු. යැපුම් කෘෂිකර්මයේ දී හැර, '**නවීන කෘෂිකර්මය**' මූලික ආර්ථික ක්‍රියාවකි. එය ආර්ථික ක්‍රියා පද්ධතියේ දී තීරණාත්මක ලෙස බැඳී පවතී. මෙවැනි පරිසරයක දී කෘෂිකාර්මික යෙදවුම් හෝ යාන්ත්‍රිකරණවල මිල වැඩි වීමක් හෝ ගොවි නිෂ්පාදන සඳහා වන මිලෙහි අඩුවීමක් ඉතාම තීරණාත්මක වශයෙන් කර්මාන්තයේ උන්නතියට හෝ පරිහානියට හේතු වේ. නවීන කෘෂිකාර්මික කටයුතු වලදී උද්ධමනය, ණය සඳහා පොලී අනුපාතයන්, ශ්‍රම මිල ඉහලයෑම හා දේශපාලන ප්‍රතිපත්ති හා සැලසුම් ඉතා තදින් බැඳී පවතී. **ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්, ගෝලීය කරණය, නිර්බාධ වෙළඳම, අනවසර හා නීති විරෝධී ආහාර ද්‍රව්‍ය ආයාත, අසාධාරණ බෙදහැරීම, ලිහිල් බදු ප්‍රතිපත්ති ආදිය ග්‍රාමීය ගොවි ප්‍රජාව කෙරේ සෘජු බලපෑම් ඇති කරයි.** මේ බව සුළු ගොවි අංශයේ සිදුවන අහිතකර බලපෑම් හා ඒවායේ ප්‍රතිවිපාක මගින් ඔප්පු වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට රාජ්‍ය අංශය හා රාජ්‍ය ප්‍රතිපත්ති කෘෂිකාර්මික අංශය කෙරෙහි ඉතා දැඩි ලෙස නැඹුරුවී තිබේ. **අනෙකුත් කෘෂිකාර්මික හා සේවා අංශ හා බලන කල කෘෂිකාර්මික අංශය වඩා ලාභදායි නොවුවත් දේශීය කෘෂිකාර්මික අංශය ශක්තිමත්ව හා සංවිධානාත්මකව වර්ධනය කරගෙන යා යුතු බව ප්‍රතිපත්ති විශ්ලේශකයන් පිළිගෙන තිබේ.** ජනගහනයේ ඉතා විශාල ප්‍රතිශතයක් කෘෂිකාර්මික අංශයේ නියැලීමත්, දේශීය ආහාර සැපයුම් පිළිබඳව ආහාර ආරක්ෂණ ප්‍රතිපත්තිය තහවුරු කිරීමත්, කෘෂි කාර්මික අංශය දළ දේශීය නිෂ්පාදනයේ දී සැලකිය යුතු ප්‍රතිශතයකින් දායක වීමත්, දේශපාලන අතින් බලවත්වීමත් ආදිය ප්‍රධාන කරුණු වශයෙන් මේ පසුබිමෙහිදී හඳුනාගත හැකිය. එහෙත් කෘෂිකාර්මික අංශයෙහි විශේෂයෙන් සුළු ගොවි අංශයෙහි, ලාභදයකත්වය තහවුරු කිරීම පිළිබඳව ක්‍රියාවලියෙහි අප සිටින්නේ නවම ආරම්භක ස්ථානයකය. සම්ප්‍රදායික ගොවිජන ආකල්පය හා සමාජ පසුතලයන් තවමත් සැලකිය යුතු පරිදි වෙනස් වී නැත. නවීන තාක්ෂණය හා කෘෂි යෙදවුම් පිළිබඳ ගොවියන් තුළ පැහැදිලි ආකල්පයක් ගොඩනැගී නැත්තේ දශක හතරක පමණ කාලයක අත්දැකීම් තුලින්, බීජ නිෂ්පාදනය හා බෙදහැරීම හා සම්බන්ධ බහුජාතික සමාගම් හා දේශීය තැරැව්කරුවන් ලැබූ ලාභ අනුපාතයන් හා දේශීය ගොවියන් දිළිඳුකම කෙරෙහි නැඹුරුවීමේ ප්‍රවණතාවයන් අතර පවත්නා

**ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් ගෝලීයකරණය, නිර්බාධ වෙළඳම, අනවසර හා නීති විරෝධී ආහාර ද්‍රව්‍ය ආයාත, අසාධාරණ බෙදහැරීම, ලිහිල් බදු ප්‍රතිපත්ති ආදිය ග්‍රාමීය ගොවි ප්‍රජාව කෙරේ සෘජු බලපෑම් ඇති කරයි.**

අදහාගත නොහැකි විසම්බන්ධය නිසයි. රාජ්‍යය ප්‍රතිපත්ති මගින් සුළු ගොවියාගේ ආරක්ෂාව හා පොදුවේ ගොවිජන ජීවිතය සුඛිත කිරීම කෙරෙහි නැඹුරුවීමකට වඩා, වැය සහිත තාක්ෂණය කෙරෙහි ගොවියා නැඹුරු කිරීම සඳහා අසීමිත පරිශ්‍රමයක් දරා ඇතිබව නම් පෙනේ. මේ බව කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා අංශය සංවිධානය කිරීමේදී රාජ්‍ය අංශය දරූ ආකල්පය හා ඉලක්ක දෙස බැලීමෙන් ඔප්පු වේ.

පාරිභෝගික රුචිය, ඉල්ලුම හා වෙළඳපොළ ක්‍රියාකාරී සම්භවයන්, ගොවිපොලෙන් පිටස්තර වූ, එහෙත් ඉතා තීරණාත්මක ලෙස සුළු ගොවියා කෙරෙහි බලපෑම් ඇති කරන සාධකයන්ගේ උත්පාදන පරිශ්‍රයක් ලෙස දක්විය හැකිය. **බොහෝ දුරට ග්‍රාමීය හෝ කෘෂිකාර්මික සංවර්ධන ප්‍රතිපත්ති ගොවියාගේ නිෂ්පාදන පිරිවැය අවම කිරීමෙන් හෝ උපරිම නිෂ්පාදන ඉලක්ක කරා ළඟා වීමෙන් හෝ ගොවිපල ආදායම් තත්ත්වය නගාලීම කෙරෙහි යොමු වූ බව නොරහසකි.** නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට වඩා, කාර්යක්ෂමව යෙදවුම් භාවිතය දියුණු කිරීමෙන් අස්වැන්න මට්ටම් ඉහළ නංවා, ඒ මගින් ගොවිපොල ආදායම වැඩි දියුණු කිරීම, කෘෂිකාර්මික වාණිජකරණයේ දී දිරි ගැන්විනි. මේ අනුව සෑම ගොවියෙකුම අතිරික්ත නිෂ්පාදනයක් කරා දයක වුවහොත් එය ගොවිපොල මිල මට්ටම් කෙරෙහි උග්‍ර ලෙස බලපානු ඇත. එසේම බොහෝ ආහාර බෝග සකස් කිරීම, ඇසිරීම හා කල් තබා ගැනීම වැනි කටයුතු වලදී අතිරේක වියදම් / පිරිවැයක් දැරීමට සිදුවන බැවින්, ආහාර නිෂ්පාදන සඳහා ගොවිපල මිල මට්ටම් සාපේක්ෂව පහල මට්ටමක පවතින බව කෙනෙකුට තර්ක කළ හැකිය.

**අස්වැන්න කෙරෙහි බලපාන ප්‍රධාන හා මූලික සාධකය පොහොර භාවිතය හෝ කෘෂි රසායනික වර්ග පාවිච්චි කිරීම හෝ පමණක් නොවන්නේ ය.**

මිල අඩු වීම නිසා ගොවිපොල ආදායම් තත්ත්වයෙහි ඇතිවන හිඟය පියවා ගැනීමට සුළු ගොවියාට වෙනත් ආදායම් මාර්ග කෙරෙහි යොමු වීමට හෝ ණය වීමට සිදු වේ. මෙම තත්ත්වය කෘෂිකාර්මික අංශයෙහි පසුබෑමක් ඇති කිරීමට හේතු විය හැකිය.

## ගොවිපොල කළමනාකරණය හා තීරණ ගැනීම

**සුළු ගොවිපොල කළමනාකරණ තීරණ (Management decisions)** ගැනීමේදී එකිනෙකට සම්බන්ධ වූ මූලික කරුණු 02 ක් කෙරේ අවධානය යොමු විය යුතු වේ.

(i) ප්‍රථමයෙන් යෙදවුම් හා අස්වැන්න අතර සම්බන්ධතාවය (උපරිම අස්වැන්නක් ලබා ගැනීම සඳහා කුමන මට්ටමකින් යෙදවුම් පවත්වා ගෙන යා යුතුද යන ගැටළුව ) **උපරිම අස්වැන්නක් සඳහා යෙදවුම් කුමන මට්ටමක පවත්වාගෙන යා යුතු ද යන්න පිළිබඳව අධ්‍යයනය කොට තීරණයකට එළඹීමට සුළු ගොවියාට අපහසුය.** ව්‍යාප්ති සේවා අංශ මගින් හෝ පර්යේෂණ ආයතන මගින් තීරණය කරනු ලබන යෙදවුම් භාවිත මට්ටම් පවත්වාගෙන යෑමට ගොවියා පෙළඹෙන්නේ එහෙයිනි. **අස්වැන්න කෙරෙහි බලපාන ප්‍රධාන හා මූලික සාධකය පොහොර භාවිතය හෝ කෘෂි රසායනික වර්ග පාවිච්චි කිරීම හෝ පමණක් නොවන්නේය.** කාලගුණික විෂමතා, ජල කළමනාකරණ ගැටළු, වන සතුන්ගෙන් වන හානි, හොඳ බීජ වර්ග නොලැබීම නිසා ඇතිවන පාඩු ආදී වෙනත් සාධකවල බලපෑම, තීරණාත්මක වන අවස්ථා ද තිබේ. එසේම ගොවිපල විශාලත්වය, භූමිය හා ක්ෂේත්‍රය පිහිටීම, පවුලේ ශ්‍රම සැපයුම, කුලී ශ්‍රම සැපයුම, කුළී ශ්‍රම අනුපාත, ආදී වෙනත් බාහිර සාධක ද ගොවිපල කාර්යක්ෂමතාවය කෙරෙහි සෘජුව හෝ වක්‍රව බලපායි. මේ අනුව, ගොවිතැන විශාල පරාසයක විහිදී පවත්නා අභ්‍යන්තර හා බාහිර සාධක සමූහයක් මගින් පාලනය කරනු ලබන බව පැහැදිලිව පෙනී යයි.

ii ඊලඟට යෙදවුම් පිරිවැය හා නිෂ්පාදනය සඳහා වන වෙළඳපොළ මිල සීඝ්‍ර උච්චාවචනයන්ට ලක් වේ නම්, ලාභදායි ලෙස කෘෂිකර්මාන්තය පවත්වාගෙන යාම අසීරුය. මේ හේතුවෙන් සුළු ගොවියා තුළ පවතින ගොවිපල තීරණ ගැනීමේ හැකියාව හා අවබෝධය සුළු ගොවි අංශයේ කෘෂිකාර්මික වර්ධනයක් ඇති කිරීමේ ක්‍රියාවලියේ දී ඉතා වැදගත් තීරණාත්මක අංශය වශයෙන්

**උපරිම අස්වැන්නක් සඳහා යෙදවුම් කුමන මට්ටමක පවත්වා ගෙන යා යුතු ද යන්න පිළිබඳව අධ්‍යයනය කොට තීරණයකට එළඹීමට සුළු ගොවියාට අපහසු ය.**

සැලකිය හැකි වේ.

**'අලෙවිකරණය' තීරණය (Marketing decision) ගොවිපොළ කළමනාකරණයේ දී ප්‍රධාන වේ.** වඩා ලාභදායි හා අලෙවිකර ගත හැකි බෝග නිෂ්පාදනය කෙරෙහි නැඹුරුවීම, කෘෂිකාර්මික වාණිජකරණයේ දී ඉතා වැදගත් සාධකයකි. අප **සුළු ගොවියන් බොහෝ දෙනෙකු අතිරේක ආදායමක් සඳහා ඕවිටි හා ගෙවතු වගාවේ යෙදී සිටී.** ඕවිටි හා ගෙවතු නිෂ්පාදන ගෙදරදොර ප්‍රයෝජනයට ගැනීම හෝ ගම තුල අලෙවි කිරීම විශේෂයෙන් දක්නට ලැබෙන්නකි. මෙහිදී ගමේ අවශ්‍යතාවය මත නිෂ්පාදනය ව්‍යාප්ත වන අතර, අලෙවිකරණ ක්‍රියාවලියේ දී අතිරේක පිරිවැයක් නොදරන නිසා සාමාන්‍ය වූ හෝ සාධාරණ මිල මට්ටමකට අලෙවි කර ගැනීම ගොවියාට ලාභදායක වේ. මෙහිදී බාහිර වෙළඳපොලක් (තම ප්‍රදේශයෙන් පිට) සඳහා බෝග නිෂ්පාදනය කරන විට පහසුවෙන් අලෙවිකර ගත හැකි කාලය හෝ කන්නය පිළිබඳව ගන්නා තීරණය (Seasonal decision) අලෙවිකරණය හා කෙලින්ම සම්බන්ධ වී පවතී. මිල අධික හා වඩා ඉල්ලුමක් ඇති එළවළු වර්ග වාරිමාර්ග පහසුකම් යටතේ, වියලි මාසවල වගා කරන්නේ නම් අලෙවිකරණය හා මිල පිළිබඳ ගැටළු මහ හරවා ගත හැකිය. මෙවැනි වියලි මාසවල බෝග වගා කිරීමේදී යෙදවුම් සඳහා අතිරේක පිරිවැයක් දැරීමට සිදුවන අතර සාපේක්ෂව සතුටුදායක මිලකට ද අලෙවි කර ගත හැකිය. **ඉල්ලුම හා සැපයුම අතර සමබරතාවය මිල කෙරෙහි බලපාන අතර, අධික සැපයුම මගින් මිල පහත වැටීමක් ද සිදුවිය හැකිය. මීට අමතරව, අතරමැදියන්ගේ ක්‍රියාකාරීත්වය, ගං වතුර උවදුරු, වැඩ වර්ජන හා අභ්‍යන්තර ආරක්ෂක හේතුමත ඇතිවන අපහසුතාවයන් ද බෝග මිල කෙරේ බලපෑම් ඇති කරවයි.** මේ පිළිබඳව ගොවියා තුල හොඳ පැහැදිලි අවබෝධයක් තිබිය යුතු වේ. ගොවි සංවිධාන ඔස්සේ ගොවීන් සංවිධානය කිරීමත්, අලෙවි කමිටු පිහිටුවීමෙන් හා අස්වැන්න ගබඩාකර තබා ගැනීමට පහසුකම් සැලසීමෙන්, මෙවැනි අවස්ථාවක ගැටළු වලින් වන පාඩුව අවම කර ගත හැකිය.

**ඉල්ලුම හා සැපයුම අතර සමබරතාවය මිල කෙරෙහි බලපාන අතර අධික සැපයුම මගින් මිල පහත වැටීමක් ද සිදුවිය හැකිය.**

කිසියම් විටෙක, ආර්ථිකයේ සංවර්ධන ක්‍රියාවලියේ දී, කෘෂිකර්මාන්තයේ සාපේක්ෂ වාසිදායකත්වය (ගොවිපල කුටුම්භ මට්ටමෙන් බලන විට ) අඩුවෙමින් පවතින විට, ඒ හේතුවෙන් කෘෂිකාර්මික රැකියා නියුක්තියේ ද වෙනස්කම් ඇති වේ. ග්‍රාමීය ශ්‍රම හමුදාවෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් කෘෂි නොවන රැකියා සඳහා යොමු වන්නේ අධ්‍යාපනය, සෞඛ්‍ය, වෘත්තීය පුහුණු වැනි අංශයන්ගෙන් රටතුළ සමස්ථ මට්ටමක සාමාජීය වශයෙන් ඇති කරන පැහැදිලි වෙනස්කම් නිසාය. මේ තත්ත්වය පැහැදිලිවම දක්නට ඇත්තේ පහතරට හා මුහුදුබඩ තෙත් කලාපයන්හි ය. මෙම ප්‍රදේශවල කුඹුරු ඉඩම් වලින් වැඩි ප්‍රතිශතයක් ආන්තික ඉඩම් වන අතර, ගංවතුර, ජලය බැස්සවීමේ ගැටළු හා කාර්මික අප ද්‍රව්‍ය ගලා යාම, ලවණ ගතිය හා මලකඩ බැදීම වැනි පාරිසරික විෂමතාවයන් නිසා අඩු ඵලදායි තත්ත්වයට පත්ව තිබේ. තවද මේ ප්‍රදේශවල කෘෂිකාර්මික කුලී ශ්‍රමය හිඟ අතර, වැටුප් ද වැඩි වීමක් පවතී. මීට සාපේක්ෂව, කෘෂිකාර්මික නොවන රැකියා අවස්ථා වර්ධනය වී ඇති අතර ඒවා වඩා ලාභදායක ද වේ. මේ නිසා, පහත රට තෙත් ප්‍රදේශවල හා මුහුදුබඩ කලාපවල තරුණයින් ගොවිතැනින් ඉවත් වීමක් ද දක්නට ලැබේ. **මහ කොළඹ ආර්ථික කලාපය හා ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිතව විශාල වශයෙන් කුඹුරු හා ගොඩ ඉඩම් ඵලදායි කෘෂිකාර්මික නිෂ්පාදනයන් සඳහා යොදවා ගෙන නැති බව පෙනේ'.** මෙම ඉඩම් විශාලත්වයෙන් හෙක් : 0.15 සිට හෙක් : 1.0 ප්‍රමාණයේ ඉඩම් වන අතර, මෙම ගොවිපොල කුටුම්භයන්ගෙන් 80% කගේ පමණ අඩු තරමින් සාමාජිකයින් දෙදෙනෙකුවත් වැටුප් ලබන හෝ ස්වයං රැකියා (කෘෂිකාර්මික නොවන) වල යෙදී ඇති බව පැහැදිලිව පෙනේ. මේ අතර විරැකියාව ද තුරන් වී නොමැත. දැනට සිදුකර ඇති සමීක්ෂණ වලට අනුව, මෙම කෘෂිකාර්මික ඉඩම් ආශ්‍රිතව සූක්ෂම කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය වැඩි දියුණු කළ හැකි අතර, ඒ තුළින් පවතින තරුණ විරැකියාවට සාපේක්ෂ

**මහ කොළඹ ආර්ථික කලාපය හා ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිතව විශාල වශයෙන් කුඹුරු හා ගොඩ ඉඩම් ඵලදායි කෘෂිකාර්මික නිෂ්පාදනයන් සඳහා යොදවා ගෙන නැති බව පෙනේ.**

විසඳුමක් දිය හැකි බවද පෙනී ගොස් තිබේ. මෙය පළාත් මට්ටමින් සිටින කෘෂිකාර්මික සැලසුම්කරුවන්ගේ අවධානය යොමු විය යුතු කාලෝචිත කාරණයක් බව අවධාරණය කළ යුතු ය.

**ශ්‍රී ලංකාවේ සුළු ගොවි අංශයේ පවත්නා ගැටළු ඉතා සංකීර්ණ වේ.**

### ප්‍රායෝගික සමාලෝචනය

**ශ්‍රී ලංකාවේ සුළු ගොවි අංශයේ පවත්නා ගැටළු ඉතා සංකීර්ණ වේ. ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුවද, කෘෂි දේශගුණික කලාප ව්‍යාප්තිය අනුව, නිවර්තන හා මධ්‍ය අක්ෂාංශක දේශගුණයන් හි ආන්තික තත්ත්වයේ සිට ඉතා සංකීර්ණ තත්ත්වය දක්වා වූ උප දේශගුණික කලාප, භූමියේ ව්‍යූහය හා මෝසම් සුළං ව්‍යාප්තිය අනුව වෙනස් වෙමින් ව්‍යාප්තව පවතී.**

මේ අනුව, පරිසර සාධක හා සමාජ සාධකයන්ට අනුව, වර්ධනය වූ ගොවිපොල ක්‍රම ඉතා සංකීර්ණ පරාසයක ව්‍යාප්තව පවතී. ඒ අනුව ගොවිපොල ගැටළු ද ඉතා සංකීර්ණ ස්වභාවයක් ගනී. කෙසේ වෙනත් හඳුනා ගත හැකි ගැටළු එකිනෙකට සම්බන්ධ වූ ප්‍රධාන කාණ්ඩ කිහිපයකට බෙද දක්විය හැකිය.

### ඉඩම් ගැටළුව

බොහෝ දුරට පවුලේ ශ්‍රමයට හා අපේක්ෂිත ආදායම් මට්ටමට සරිලන කෘෂිකාර්මික ව්‍යවසායක් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් ඉඩම් ප්‍රමාණයක් වගා කිරීමට නොමැතිකම ප්‍රධාන ගැටළුවයි. 1950-1960 ගණන් වල දියුණු තාක්ෂණික ක්‍රම මගින් සූක්ෂම වගා ක්‍රම තුලින් ප්‍රමාණවත් ලෙස පවුලේ ශ්‍රමය ගොවිපොලෙහි යොදවා ගැනීමටත්, බලාපොරොත්තු වූ ආදායමක් සඳහා වැඩි අස්වැන්නක් ලබා ගැනීමත්, අපේක්ෂා කරන ලදී. මෙම ප්‍රවේශයෙහි යම් ඵලදායිතාවක් දක්නට හැකි වුවද අනපේක්ෂිත පරිදි යෙදවුම් හා ශ්‍රම මිල ඉහල යැමත්, නවීන බෝග ලෙඩ රෝග හා කෘමි උවදුරු වලට පහසුවෙන් නැඹුරුවන සුළු වීමත් නිසා අපේක්ෂාවන් එපරිදිම ඉටු නොවූ බව සඳහන් කළ යුතුය.

### ගොවිපොල ක්‍රම හා සංවර්ධනය කිරීම ආශ්‍රිත ගැටළු

වඩා ඵලදායි ඒකාබද්ධ ගොවිපොල ක්‍රම අත්හද බැලීම හා දියුණු කර පවත්වා ගෙන යාම සාම්ප්‍රදායික ක්‍රම වලට වඩා වියදම් අධික හෙයින් සුළු ගොවි අංශයෙහි දියුණු ගොවිපොල ක්‍රම දක්නට නොලැබේ. සුළු ගොවි අංශයෙහි සත්ත්ව පාලනය හා ආහාර බෝග වගා ක්‍රම හා ඒකාබද්ධව පවත්වා ගෙන යාම අපහසු වන්නේ ඉඩම් හිඟකම හා සමාජ හා පාරිසරික ගැටළු නිරන්තරයෙන්ම මතු වන නිසාය.

### සම්පත් කළමනාකරණය ආශ්‍රිත ගැටළු

බොහෝ දුරට ගොවිපොල කුටුම්භ ආශ්‍රිත ආදායම් හා සම්පත් කළමනාකරණ අංශයන්ගේ බොහෝ ගැටළු දක්නට ලැබේ. ගොවියා තම ආදායම් හරිහැටි කළමනාකරණය කිරීමේ අපහසුතාවයන්ට ලක් වුවහොත් යෙදවුම් සඳහා ගොවිපොල ප්‍රාග්ධනයක් ඒකරාශී කර ගැනීමට අපහසු වේ. තවද, ග්‍රාමීය අංශයෙහි සනීපාරක්ෂක හා ප්‍රවාහන ගැටළු නිසා කෘෂිකාර්මික / ග්‍රාමීය ශ්‍රම ඵලදායිතාවය ද හීන වන අවස්ථා දැකිය හැකිය. සේවා අංශයෙන් බලන කල, ග්‍රාමීය කෘෂිකාර්මික සේවා සඳහා සුළු ගොවි අංශයෙන් වන ඉල්ලුමෙහි වෙනසක් දක්නට නැති අතර, අපරීක්ෂාකාරී ව හෝ අසාර්ථක ලෙස කෘෂි යෙදවුම් යෙදවීම පිළිබඳ වාර්තා හා සිද්ධි නිතරම අසන්නට ලැබේ. මේ නිසා සුළු ගොවි අංශයෙ හි වඩා ඵලදායි සම්පත් කළමනාකරණ පරිසරයක් හා සංවේදිතාවයක් ගොඩ නැගිය යුතුව තිබේ.

### අසංවිධානාත්මක භාවය සහ ඒ හා සම්බන්ධ වූ අලෙවිකරණ ගැටළුව

මේ කාලයේ, බොහෝ දුරට වාර්තාවන ගොවි ගැටළුවක් නම්, කෘෂි නිෂ්පාදන අලෙවිකරණයේ දී පැන නගින ගැටළුයි. වඩා තීරණාත්මක බෝග පමණක් සඳහා විවෘත ආර්ථිකය යටතේ වන ආනයන හා අපනයන කටයුතු මගින් කෘෂි නිෂ්පාදන ආශ්‍රිත අලෙවි ගැටළු ග්‍රාමීය අංශයෙහි ජනනය කෙරෙන බව මහජන මතයයි. එසේ වුව ද, **ගොවියන්ගේ අසංවිධානාත්මක භාවය හා මෙවැනි ගැටළු වලට මුහුණ දීම සඳහා වඩා ඵලදායි සැලසුම් සකස් කර ගැනීමේදී ගොවි සංවිධාන සතුව ඇති ආවේනික අසරණ භාවය ද යම් තරමකින් හෝ අලෙවිකරණ ගැටළු පිටුපසින් දක්නට ඇති බව**

**ගොවි සංවිධාන සතුව ඇති ආවේනික අසරණ භාවය ද යම් තරමකින් හෝ අලෙවිකරණ ගැටළු පිටුපසින් දක්නට ඇති බව ද, නිරීක්ෂකයින්ගේ මතයයි.**

ද, නිරීක්ෂකයින්ගේ මතයයි.** ශ්‍රී ලංකාව වැනි දියුණුවන රටවල් වලට පොදු ලක්ෂණයක් නම් කෘෂිකාර්මික නිෂ්පාදන ගොවිපොලේ සිට කෙලින්ම වෙළඳපල කරා පැමිණීමයි. වඩා

**ගොවියාට වාසිදයක මිල මට්ටම් පවත්වාගෙන යාම සඳහා නිෂ්පාදනය වෙළඳ පොලට අනුකූලව සීමා කිරීමට හෝ මුළු නිෂ්පාදනයට එකවර වෙළඳ පොල කරා පැමිණීම සීමා කිරීමට හෝ කටයුතු කළ යුතු වේ.**

ඵලදයි කාල වලට කෘෂි නිෂ්පාදන ඉතා විශාල වශයෙන් කෙලින්ම වෙළඳපොලට ගලා එන අතර, එයට අනුපාතිකව ඉල්ලුම් නම්‍යතාවයක් ඇති නොවන නිසා මිල පහත වැටීමක් සිදුවේ. මෙම මිල පහත වැටීම තදින්ම බලපාන්නේ නිෂ්පාදකයාට ය. එම නිසා, **ගොවියාට වාසිදයක මිල මට්ටම් පවත්වාගෙන යාම සඳහා නිෂ්පාදනය වෙළඳපලට අනුකූලව සීමා කිරීමට හෝ මුළු නිෂ්පාදනයට එකවර වෙළඳපල කරා පැමිණීම සීමා කිරීමට හෝ කටයුතු කළ යුතු වේ.** විශාල වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳපොල කරා ගලාගෙන ඒම සීමා කිරීම සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග කිහිපයක් ගත හැකිය.

* නිෂ්පාදනයෙන් යම්කිසි ප්‍රතිශතයක් යම් කිසි කාලයක් සඳහා ගබඩා කර තැබීම
* නිෂ්පාදනයෙන් යම් කිසි ප්‍රතිශතයක් කෘෂි ආශ්‍රිත කර්මාන්ත සඳහා හෝ සැකසීම සඳහා යෙදවෙන පරිදි ආර්ථික කටයුතු පුළුල් කිරීම හෝ අපනයනය කිරීම

හා

* නිෂ්පාදන අලෙවි ක්‍රියාවේ යෙදී සිටින සංවිධානාත්මක ආයතන හා ව්‍යවසායන් මගින් වෙළඳපොල පාලනය කර ගැනීම

මෙහිදී රජයට විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට සිදුවන අතර, මේ සම්බන්ධයෙන් මෙතෙක් ගෙන ඇති ක්‍රියා මාර්ග ප්‍රමාණවත් නොවන බවද පැවසිය යුතුව තිබේ. කෘෂි ආශ්‍රිත (බෝග හෝ කාර්මික නිෂ්පාදන) නිෂ්පාදන සඳහා ඉල්ලුමක් නිර්මාණය වන ආකාරයේ සැලසුමක් තිබිය යුතු වේ. **කෘෂිකර්ම, පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යාංශයේ** කෘෂි ආශ්‍රිත කර්මාන්ත සංවර්ධන හා අලෙවිකරණය පිළිබඳ කෘෂි ව්‍යවසාය සංවර්ධනය කිරීමේ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාබද්ධ වැඩසටහන් මාලාව මෙම අවශ්‍යතාවයට හොඳම නිදසුන්ය. මෙම වැඩ සටහන් මාලාව 1999 - 2002 දක්වා පලාත් සභා බල ප්‍රදේශ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර මෙහි මුල් වැඩසටහන 1999 වයඹ පලාත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක විය.

ආචාර්ය ඩී. තෙන්නකෝන්
**අංශ ප්‍රධාන**
**සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

## "දින දුන කළහොත් බිජුකම..............................."

**"ජන කවි"** අපේ උරුමයයි. **මුඛ පම්පරාගතව පැමිණෙන ජනකවි සුරැකීම පිණිස කඩිනම් පියවර ගත යුතු වේ. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සංඛ්‍යාන නිලධාරි** ටී.ජී. **සෝමරත්න මහතාට හලාවත / තබ්බෝව ප්‍රදේශයේ දී ලැබුණු අපූරු ජන කවියක් "ගොවි ජනතා"** වට යොමු කළේය. මේ එම ජන කවියයි.

කුජ ද වපුලොත් වේ කෙත් පාළුම
ගුරු ද යසදේ කිවි දින විලසම
පහ ද **දුන දින කළ හොත් බීජුකම**
සැම ද සිරි දේ ගොවි සිත කරපෙම

**- සංස්කාරක -**